**ශීර්ෂ 276 - බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2014 වර්ෂය**

---

මෙම වාර්තාවේ 1 ඡේදයේ සිට 2 ඡේදය දක්වා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ගිණුම් පිළිබඳ පොදු තොරතුරු ඇතුළත් කර ඇති අතර 3 ඡේදයේ සිට ශීර්ෂයට අදාල විගණන නිරීක්ෂණ දැක්වේ.

1. **දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ඇති ප්‍රාදේශීය ලේකම් කාර්යාල**

---

| | | | | | |
|---|---|---|---|---|---|
| (අ) | මහියංගණය | (ඊ) | බදුල්ල | (ඔ) | බණ්ඩාරවෙල |
| (ආ) | රිදීමාලියද්ද | (උ) | පස්සර | (ඕ) | හපුතලේ |
| (ඇ) | කන්දකැටිය | (ඌ) | ලුණුගල | (ක) | හල්දුම්මුල්ල |
| (ඈ) | මීගහකිවුල | (එ) | හාලිඇල | (ග) | වැලිමඩ |
| (ඉ) | සොරණාතොට | (ඒ) | ඇල්ල | (ජ) | ඌවපරණගම |

## 1.1 විගණන විෂය පථය

---

බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2015 මැයි 20 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් හා සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය හා ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය හා ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. ගිණුම්

## 2.1 විසර්ජන ගිණුම

### (අ) මුළු ප්‍රතිපාදනය හා වියදම

බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 744 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 604 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ශුද්ධ ප්‍රතිපාදනයෙන් ඉතිරිවීම රු.මිලියන 140 ක් හෙවත් සියයට 19 ක් වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2014 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | |
| පුනරාවර්තන | 486 | 476 | 10 | 02 |
| මූලධන | 258 | 128 | 130 | 50 |
| **එකතුව** | **744** | **604** | **140** | **19** |

### (ආ) වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

විවිධ කාර්යයන් සඳහා අමාත්‍යාංශ 22 කින් හා දෙපාර්තමේන්තු 17 කින් සමාලෝචිත වර්ෂයේදී පිළිවෙලින් රු.මිලියන 3,411 ක් හා රු.මිලියන 714 ක් වශයෙන් රු.මිලියන 4,125 ක ප්‍රතිපාදන දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ලබා දී තිබුණි. එම ප්‍රතිපාදනවලින් පිළිවෙලින් රු.මිලියන 2,694 ක් හා රු.මිලියන 704 ක් වශයෙන් රු.මිලියන 3,398 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ලබා දී තිබුණු ප්‍රතිපාදනවලින් පිළිවෙලින් රු.මිලියන 717 ක් හා රු.මිලියන 10 ක් වශයෙන් රු.මිලියන 727 ක ප්‍රතිපාදන ඉතිරි වි තිබුණි.

**2.2 අත්තිකාරම් ගිණුම**

**2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාල රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 27601 | 44 | 39 | 28 | 29 | 146 | 132 |

**2.3 අග්‍රිම ගිණුම**

බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2014 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ගිණුමේ ශේෂය රු.294,331 ක් විය.

**2.4 පොදු තැන්පත් ගිණුම**

බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2014 දෙසැම්බර් 31 දිනට පොදු තැන්පත් ගිණුමේ ශේෂය රු. මිලියන 600 ක් විය.

**2.5 විගණන නිරීක්ෂණය**

2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ 1.1 ඡේදයේ දක්වා ඇති පරිදි කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ වාර්තාවේ ඇතුළත් නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් නිරීක්ෂණ 3 ඡේදයේ දක්වා ඇත.

## 3. ශීර්ෂ 276 - බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

### 3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බැව් නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය | නිරීක්ෂණය |
|---|---|---|
| හානි පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 110 | මහියංගන හා සොරණාතොට ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් පවත්වා නොතිබුණි. |
| බැරකම් පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 214 | පවත්වා නොතිබුණි. |
| විදුලි උපකරණ පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 454(2) | පවත්වා නොතිබුණි. |
| පොදු තැන්පත් තුලන ගිණුම | මුදල් රෙගුලාසි 565(3) | හල්දුම්මුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් පිළියෙල කර නොතිබුණි. |
| රාජකාරී දුරකථන ලේඛනය | මුදල් රෙගුලාසි 845(1) | පවත්වා නොතිබුණි. |

### 3.2 විගණන විමසුම් වලට පිළිතුරු දීම

බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත සමාලෝචිත වර්ෂයේදී ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 36 කට 2015 මාර්තු 31 දින වන විටද පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණු අතර, එම විමසුම්වලට අදාල ගණනය කළහැකි ගනුදෙනුවල වටිනාකම රු.233,627,230 ක් විය.

### 3.3 විසර්ජන ගිණුම

#### 3.3.1 අයවැය විචලනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැය විෂයයක් සඳහා සළසා තිබුණු රු.90,000,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(ආ) වැය විෂයයන් 03 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදනය උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 20 සිට සියයට 39 දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**3.3.2 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබාදුන් ප්‍රතිපාදන**

විවිධ කාර්යයන් සඳහා වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දි තිබුණු ප්‍රතිපාදන උපයෝජනය කිරිම සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරික්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරික්ෂණය විය

**(අ) ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය**

සමාලෝචිත වර්ෂයේදී ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් රු.මිලියන 3,061 ක ප්‍රතිපාදන ලබා දි තිබුණු අතර, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ඉන් රු.මිලියන 2,377 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ලබා දී තිබුණු ප්‍රතිපාදනවලින් රු.මිලියන 683 ක් ඉතිරි වී තිබුණි. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් කර තිබුණු උපයෝජනයන් සම්බන්ධයෙන් සිදු කළ නියැදි පරීක්ෂාවේදී පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(i) අඩු ආදායම්ලාභී පවුල් මූලික කරගත් විශේෂ වැඩසටහන**

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- ඌවපරණගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පරණගම වසම තුළ අඩු ආදායම්ලාභී පවුල් මූලික කරගත් දිවිනැගුම වැඩසටහන යටතේ මැටි පදම් කිරීමේ යන්ත්‍රයක් මිලදී ගැනීම සඳහා කාර්මික සංවර්ධන මණ්ඩලය නමින් 2013 දෙසැම්බර් 31 දින ලියා තිබූ රු.479,494 ක් වටිනා චෙක්පත 2014 අගෝස්තු 26 දින වන විටත් විෂය භාර නිලධාරියා භාරයේ පැවතුණි.
- 2013 දෙසැම්බර් 31 දින මිලදීගෙන තිබූ රු.245,700 ක් වටිනා සෙවිලි තහඩු 182 ක් ප්‍රතිලාභීන්ට බෙදා නොහැර අනාරක්ෂිතව පරණගම වසමේ පෞද්ගලික නිවසක ගොඩගසා තිබුණි. 2013 දෙසැම්බර් මාසය වන විට ප්‍රතිලාභීන් මඩු ඉදිකර තිබුණ ද, විගණන දිනය වූ 2014 අගෝස්තු 25 දින වන විටත් සෙවිලි තහඩු ලබා නොදීම නිසා ඒවා දිරාපත් වෙමින් තිබුණි. ප්‍රතිලාභීන් විසින් මේ සම්බන්ධව ප්‍රාදේශීය ලේකම් හා අදාළ නිලධාරීන් දැනුවත් කර තිබුණද ඒ සම්බන්ධව ඉදිරි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

- ඉහත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ කාල රාමුවක් ව්‍යාපෘති වාර්තාවට ඇතුළත් කර තිබුණද, කාලපරිච්ඡේදය තුළ අපේක්ෂිත ක්‍රියාකාරකම් සිදු කර නොතිබුණු අතර ව්‍යාජ මූල්‍ය ප්‍රගතියක් පෙන්නුම් කර තිබුණි.
- 2013 දෙසැම්බර් මාසයේ ආරම්භ කිරීමට නියමිතව තිබූ මෙම ව්‍යාපෘතිය 2014 අගෝස්තු මාසය වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි. මේ හේතුවෙන් ඌවපරණගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ අඩු ආදායම්ලාභී පවුල් නගා සිටුවීමේ අරමුණින් ක්‍රියාත්මක කර තිබුණු එම ව්‍යාපෘතියෙන් අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීමට නොහැකි වී තිබුණි.

**(ii) ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී නිවැරදි රේට හා ප්‍රමාණ යොදා නොගැනීම**

2014 වර්ෂයේ ක්‍රියාත්මක කර තිබූ සංවර්ධන ව්‍යාපෘති 27 ක ඇස්තමේන්තු පරික්ෂා කිරීමේදී 1:2:4 (මි.මී.19) මිශ්‍රණයේ කොන්ක්‍රීට් සඳහා අඟල් ¾ ප්‍රමාණයේ සෑම ගල් කියුබ් 0.9 ක් සඳහාම ගල් කියුබ් 0.1 ක් සඳහා අමතර ප්‍රවාහන පිරිවැයක් යොදා ගැනීම නිසා අදාල කොන්ත්‍රාත්කරුවන්ට රු.169,330 ක් වැඩිපුර ගෙවා තිබුණි.

**(iii) ව්‍යාජ මිණුම් මත ගෙවීම් කිරීම**

සංවර්ධන ව්‍යාපෘති 03 ක් සඳහා ව්‍යාජ මිනුම් මත ගෙවීම් කිරීම නිසා රු.247,068 ක් අදාල ගිවිසුම්ගත සමිතිවලට වැඩිපුර ගෙවා තිබුණි.

**(iv) ලුණුගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය**

ලුණුගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2014 වර්ෂයේ ක්‍රියාත්මක කර තිබූ සංවර්ධන ව්‍යාපෘතිවල සිමෙන්ති ප්‍රවාහන පිරිවැය ඇස්තමේන්තු කිරීමේදී පැටවීමේ හා බෑමේ කුලී ඇතුළත් HSR රේටයන් යොදාගෙන ඊට නැවත පැටවීමේ හා බෑමේ කුලී ඇතුළත් කර ප්‍රවාහන පිරිවැය ඇස්තමේන්තු කර තිබුණි. වැලි ප්‍රවාහන පිරිවැය ඇස්තමේන්තු කිරීමේදී බෑමේ කුලී ඇතුළත් නොවන HSR රේටයන් යොදාගෙන ඊට දිස්ත්‍රික් මිළ කමිටුව විසින් බෑමේ කුලී ඇතුළත් කර ප්‍රවාහන පිරිවැය ඇස්තමේන්තු කර තිබුණි. මේ සම්බන්ධයෙන් ව්‍යාපෘති 06 ක සිදු කළ නියැදි පරීක්ෂාවකින් රු.60,904 ක් අදාල කොන්ත්‍රාත්කරුවන්ට වැඩිපුර ගෙවා තිබුණි.

**(v) ඌවපරණගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය**

හන්තානන්ගොඩ ගම හරහා මාර්ගය කුට්ටිගල් ඇතිරීම ව්‍යාපෘතියේ නිමි වැඩ වටිනාකම රු.965,019 ක් වී තිබුණි. එම ව්‍යාපෘතියට අදාල ලිපිගොනුව හා ක්ෂේත්‍ර ලොග් සටහන් විධිමත් පරිදි යාවත්කාලීන කර නොතිබූ අතර ක්ෂේත්‍ර ලොග් සටහන් පොතෙහි තබා ඇති සටහන් සාවද්‍ය බව විගණනයේ දී අනාවරණ විය.

**(vi) පස්සර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය**

පස්සර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2014 වර්ෂයේ ක්‍රියාත්මක කර තිබූ සංවර්ධන ව්‍යාපෘති 03 ක ඇස්තමේන්තු පරීක්ෂා කිරීමේදී 1:2:4 (මි.මී.19) මිශ්‍රණයේ කොන්ක්‍රීට් සඳහා නිවැරදි රේටය (ST1-047) යොදා නොගැනීම නිසා අදාල කොන්ත්‍රාත්කරුවන්ට රු.37,722 ක් වැඩිපුර ගෙවා තිබුණි.

## 3.4 පොදු තැන්පත් ගිණුම

වර්ෂ 02 ක් ඉක්මවූ එකතුව රු. 187,064,900 ක් වූ තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

## 3.5 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.6,324,273 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ වර්ෂ 01 සිට වර්ෂ 21 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණත්, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය අපොහොසත් වී තිබුණි.

## 3.6 අනුකූල නොවීම

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

මහියංගන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සංචිත වාහනයට රු.222,179 ක් වටිනා ඩීසල් ලීටර් 1,873 ක් භාවිතා කර වාහනය ධාවනය කර තිබුණත්, මුදල් රෙගුලාසි 1646 ප්‍රකාරව දෛනික ධාවන සටහන් හා මාසික සංසිද්ධි වාර්තා ලියා නොතිබුණි.

## 3.7 දේශීය මූල්‍යකරණ මගින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම් හා ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන් පිළිබඳව විගණන නියැදි පරීක්ෂණ වලදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

### (අ) ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් ඇස්තමේන්තු පිරිවැය රු.4,870,330 ක ව්‍යාපෘති 07 ක් 2014 ඔක්තෝබර් මාසයේ සිට දෙසැම්බර් මාසය අතර කාල පරාසය තුළ ආරම්භ කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විට එම ව්‍යාපෘති වෙනුවෙන් රු.884,842 ක් වැය කර තිබුණත්, එම ව්‍යාපෘති නිම නොකර අතහැර දමා තිබුණි.

### (ආ) ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පහත සඳහන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල යටතේ ව්‍යාපෘති 108 ක් ක්‍රියාත්මක කර 2014 දෙසැම්බර් 31 දින වන විට නිම කළ යුතුව තිබුණත්, විවිධ හේතුන් නිසා එම ව්‍යාපෘති නිම කිරිමට නොහැකි වි තිබුණි. විස්තර පහත දැක්වේ.

| | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | ව්‍යාපෘති ගණන | ඇස්තමේන්තු ගත පිරිවැය | ආරම්භ කළ කාල වකවානු | 2014.12.31 දින වන විට වියදම | ප්‍රමාදයට හේතු |
|---|---|---|---|---|---|---|
| | | | රු. | | රු. | |
| (i) | කන්දකැටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 03 | 4,388,426 | 2014 අගොස්තු සිට නොවැම්බර් දක්වා | 1,600,000 | අයහපත් කාල ගුණය |
| (ii) | ඌව පරණගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 13 | 10,215,175 | 2014 අගෝස්තු සිට දෙසැම්බර් දක්වා | 1,600,000 | අයහපත් කාල ගුණය හා කාලය ප්‍රමාණවත් නොවිම |
| (iii) | පස්සර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 16 | 9,876,160 | 2014 මැයි සිට දෙසැම්බර් දක්වා | 1,368,802 | අයහපත් කාලගුණය, කාලය ප්‍රමාණවත් නොවිම, අදාල ආයතනවලින් අනුමැතිය ලබා ගැනිම, ඇස්තමේන්තු සංශෝධනය කිරිම |
| (iv) | හපුතලේ ප්‍රාදේශිය ලේකම් කාර්යාලය | 03 | 24,302,608 | 2014 සැප්තැම්බර් සිට දෙසැම්බර් දක්වා | 5,242,701 | කාලගුණය, විරෝධතා පැවැතිම |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| (v) | බණ්ඩාරවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 14 | 14,993,644 | 2014 මැයි සිට දෙසැම්බර් දක්වා | 10,274,661 | අයහපත් කාලගුණය නිසා |
| (vi) | මහියංගනය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 32 | 23,452,626 | 2014 අගෝස්තු සිට දෙසැම්බර් දක්වා | 6,970,232 | අයහපත් කාලගුණය හා කාලය ප්‍රමාණවත් නොවීම |
| (vii) | ලුණුගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 16 | 6,968,599 | 2014 අගෝස්තු සිට දෙසැම්බර් දක්වා | 6,498,499 | අයහපත් කාලගුණය හා කාලය ප්‍රමාණවත් නොවීම |
| (viii) | වැලිමඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 04 | 3,845,583 | 2014 නොවැම්බර් හා දෙසැම්බර් | 1,259,385 | අයහපත් කාලගුණය |
| (ix) | රිදිමාලියද්ද ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 07 | 7,145,053 | 2014 ජුලි සිට නොවැම්බර් දක්වා | 1,311,028 | අයහපත් කාලගුණය |

### 3.8 මතභේදයට තුඩු දෙන ගනුදෙනු

බදුල්ල ප්‍රාදේශීය ලේකම් තනතුරේ නිත්‍ය රාජකාරී හා පස්සර ප්‍රාදේශීය ලේකම් තනතුරේ වැඩ බැලීමේ රාජකාරී ඉටුකරමින් බදුල්ල ප්‍රාදේශීය ලේකම්වරයා කාර්යාල දෙකේම නිල වාහන භාවිතා කර තිබූ අතර මාස 04 ක් සඳහා කාර්යාල දෙකෙන්ම මාසික ඉන්ධන දීමනාව ලෙස රු.67,984 ක් වැඩිපුර ලබා ගෙන තිබුණි.

### 3.9 පාඩු හා හානි

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ පාඩු හා හානි පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) මුදල් රෙගුලාසි 104(4) ප්‍රකාරව අලාභ හානියක් සිදු වූ දිනයේ සිට මාස තුනක් ඉකුත් වීමට පෙර ඒ සම්බන්ධව පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කළ යුතු වුවත් එකතුව රු.2,635,744 ක අලාභ හානි 10 ක් සම්බන්ධයෙන් එලෙස කටයුතු කර නොතිබුණි.

(ආ) එකතුව රු.44,140 ක අලාභ හානි 03 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 109(1)(අ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

## 3.10 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 4 | 4 | - | - |
| (ii) | තෘතියික මට්ටම | 93 | 64 | 29 | - |
| (iii) | ද්විතියික මට්ටම | 1,005 | 776 | 232 | 3 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 108 | 109 | 6 | 7 |
| | වෙනත් | 32 | 8 | 24 | - |
| | එකතුව | 1,242 | 961 | 291 | 10 |